ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
டிஜிட்டல் பொருளாதார அமைச்சு
MINISTRY OF DIGITAL ECONOMY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS

10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.
10 ஆம் மாடி,சுஹூருபாய, ஸ்ரீ சுபூத்திபுர வீதி, பத்தரமுல்லை.
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. } DRP/OP/10/15/03 | ඔබේ අංකය / உமது இல. / Your Ref. } | දිනය / திகதி / Date } 2025.08.25 |

"විශ්වසනීය පුද්ගල අනන්‍යතාව හැඳුනුම්පතයි" "அடையாள அட்டை - நம்பகத்தன்மையான தனிநபர் அடையாளம்" "Identity Card, the Trusted Personal Identity"

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>තාවකාලික පදිංචි ලිපිනය සනාථ කර ගැනීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ අංක DRP/OP/01/DS/03 (වෙළුම IV) දරණ 2023.10.03 දිනැති ලිපිය හා බැඳේ.

02) ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසියන් වෙත ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේදී ස්ථිර පදිංචිය සනාථ කිරීමට නොහැකි අවස්ථාවලදී තම ළඟම ඥාතියෙකුගේ/හිතවතෙකුගේ ලිපිනය භාවිතා කර ජාතික හැඳුනුම්පත සකස් කරගැනීම සඳහා පු.ලි.දෙ/මෙ/01/04 ආකෘතිය හා පදිංචිය සනාථ කිරීමට නොහැකි අනෙකුත් ඉල්ලුම්කරුවන් සඳහා ලිපිනය දරන්නාගේ කැමැත්ත මත තම ළඟම ඥාතියෙකුගේ/හිතවතෙකුගේ ලිපිනය භාවිතා කර තාවකාලික පදිංචිය තහවුරු කරමින් ජාතික හැඳුනුම්පත සකස් කරගැනීම සඳහා පු.ලි.දෙ/මෙ/02/07 ආකෘතිය හඳුන්වා දී ඇත.

03) නමුත් අත්‍යවශ්‍ය කරුණක් ඇතුළත් කරමින් එම ආකෘතිපත්‍ර සංශෝධනය කරන ලද අතර, 2025.09.01 දින සිට ජාතික හැඳුනුම්පත් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී මේ සමඟ අමුණා ඇති සංශෝධිත ආකෘතිපත්‍ර භාවිතා කරන ලෙසත් ඊට අදාලව නිකුත් කර ඇති ලිපිවල සඳහන් අනෙකුත් උපදෙස් එලෙසම අනුගමනය කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

04) තවද, ඉල්ලුම්කරුවන් කුලී ගිවිසුමක්, බදු ගිවිසුමක් වැනි විධිමත් නීත්‍යානුකූල ලියවිල්ලක් මත තාවකාලිකව පදිංචිව සිටින්නේ නම් ඉහත සඳහන් ආකෘතිපත්‍ර භාවිතා කිරීම අනිවාර්යය නොවන අතර මෙම කරුණු සම්බන්ධයෙන් ඔබ කොට්ඨාසයට අයත් සියලුම සහතික කිරීමේ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

මේ සම්බන්ධයෙන් ඔබ ලබාදෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**එම්.එස්.පී.සූරියප්පෙරුම**
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් (වැ.බ)

පිටපත්:

01. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
02. ලේකම්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
03. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කරු.දැ.ගැ.ස.
04. විගණකාධිපති - කරු.දැ.ගැ.ස.
05. සියලුම මාණ්ඩලික නිලධාරීන් (පු.ලි.දෙ.) - කරු.දැ.ගැ.ස. සහ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා
06. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත පු.ලි.දෙ. සංවර්ධන නිලධාරීන් - කරු.දැ.ගැ.ස./ අ.ක.ස

දුරකථන / தொலைபேசி / Telephone } (011) 5226100
ෆැක්ස් / பெக்ஸ் / Fax } (011) 2862198
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail } info@drp.lk
වෙබ් / இணையதளம் / Web } www.drp.gov.lk